සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2016 ජනවාරි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2016-01-31
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත සුපර්ටෙක් (පෞද්ගලික) සමාගම,** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති විදේශීය සමාගමකි. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන **ජයසූරිය, සීමාසහිත සුපර්ටෙක් (පෞද්ගලික) සමාගමේ** ශ්‍රී ලංකා ප්‍රධානියා (Country Head) වේ. වර්ෂය තුළදී ඔහු කිහිප වතාවක් පිටරට සංචාරය කර ඇති අතර විස්තර පහත දැක්වේ:

| ශ්‍රී ලංකාවෙන් පිටත්වීම | ශ්‍රී ලංකාවට ළඟාවීම |
|---|---|
| 2014.03.23 | 2014.05.08 |
| 2014.07.27 | 2014.09.16 |
| 2014.11.10 | 2015.01.07 |
| 2015.03.02 | 2015.04.28 |

**ඔබ විසින් කළ යුතු දැ:**

2014/15 තක්සේරු වර්ෂයට අදාලව ශ්‍රී ලංකාවේ බදු අරමුණු සඳහා,

(a) **සීමාසහිත සුපර්ටෙක් (පෞද්ගලික) සමාගමේ** සහ, (ලකුණු 03)

(b) **ජයසූරියගේ,** (ලකුණු 02)

වාසික තත්ත්වය (resident status) **හඳුනා දක්වන්න**. (මුළු ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

**සොයිසා මහතා** 2014 ජුනි මාසයේදී ඔහුගේ බිරිඳගෙන් දික්කසාද විය. එදින සිට, වයස අවුරුදු 15 ක් වන ඔහුගේ දියණිය **නෙත්මි**, ඇයගේ මව වන **සොයිසා මහත්මිය** සමඟ ජීවත් වෙයි. ඇයගේ සියලුම වියදම් දරනු ලබන්නේ **සොයිසා මහත්මිය** විසිනි.

ඔබ **සොයිසා මහතාගේ** බදු උපදේශකවරයා ය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් ඒවා ඔහුට **පැහැදිලි කරන්න**:

(a) 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ අරමුණු සඳහා "දරුවා" යනු කවරෙක් ද? (ලකුණු 03)

(b) **නෙත්මිගේ** ආදායම එකතු කළ යුත්තේ කා හට ද? (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත AB සමාගමේ** පැරණි සේවකයෙකු වන (long standing employee) **පෙරේරා**, 2015 ජනවාරි මාසයේ දී හදවත් සැත්කමකට භාජනය විය. ඒ සඳහා සමාගම විසින් රු.100,000/- ක විශේෂ ගෙවීමක් කරන ලදී. සමාගම මෙම ගෙවීම ප්‍රසාද දීමනාවක් වශයෙන් සළකා තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුව, **පෙරේරාගේ** ආදායම් බද්ද සඳහා මෙම ගෙවීම යටත් වන්නේදැයි **පැහැදිලි කරන්න**. (ඔබගේ පැහැදිලි කිරීම සනාථ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විනිශ්චිත නඩු තීන්දු දක්වන්න) (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

ජාතිය ගොඩනැගීමේ බදු (Nation Building Tax - NBT) පනතේ විධිවිධානයන්ට අනුව, ජාතිය ගොඩනැගීමේ බද්දට යටත්වන ක්‍රියාකාරකම් **සඳහන් කරන්න**.

(ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

නීතිඥයෙකු වන **සුදත්** 2012 වර්ෂයේදී සිය වෘත්තිය ආරම්භ කළේය. **සුදත්ගේ** මිතුරෙකු වන **ජගත්, සුදත්ගේ** ව්‍යාපාරයට හවුල්කරුවකු ලෙස සම්බන්ධ වී 2013 වර්ෂයේ දී හවුල් ව්‍යාපාරයක් ඇරඹීය. නව ව්‍යාපාරයේ නම **SJ ඇසෝසියේට්ස්** වේ. **සුදත්** සහ **ජගත්** පිළිවෙලින් 2:1 අනුපාතයට ලාභ බෙදා ගැනීමට එකඟ වූහ. මසකට රු.50,000/- ක වැටුපකට **සුදත්** හිමිකම් කියනු ලබයි.

2014/15 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තොරතුරු පහත පරිදි වේ:

| | **ඇමරිකානු ඩොලර් ($)** | **රු.** | **රු.** |
|---|---|---|---|
| වෘත්තීය ගාස්තු: | | | |
| දේශීය මුදලින් | | | 10,000,000 |
| විදේශීය මුදලින් | 25,100 | | 3,539,100 |
| | | | 13,539,100 |
| අඩු කළා: | | | |
| වැටුප් | | 4,200,000 | |
| දුරකතන | | 125,000 | |
| ලිපිද්‍රව්‍ය | | 45,000 | |
| ක්ෂය වීම් | | 36,800 | |
| විදුලිය | | 55,000 | |
| පොලිය | | 258,000 | |
| ජලය | | 36,000 | |
| විදේශීය මුදල් ආදායම ඉපැයීමට දරණ ලද වියදම් | | 525,000 | (5,280,800) |
| | | | 8,258,300 |
| ලාභ කොටස: **සුදත්** | | 5,505,533 | |
| **ජගත්** | | 2,752,767 | (8,258,300) |
| | | | - |

<u>සටහන්</u>:

(1) බදු අරමුණු සඳහා ක්ෂය දීමනාව රු.60,000/- කි.

(2) **සුදත් ට** ඔහුගේ වැටුප වශයෙන් ගෙවූ රු.600,000/- වැටුප්වල ඇතුලත් වේ.

(3) පොලිය ගෙවා ඇත්තේ **SJ ඇසෝසියේට්ස්** වෙත ජගත් විසින් ලබා දුන් ණය මුදල සඳහා ය.

(4) විදේශීය රටවලදී සපයන ලද සේවාවන් වෙනුවෙන් විදේශීය මුදලින් වෘත්තීය ගාස්තු ලැබී තිබුණු අතර එම ඉපැයීම් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) ලාභ බෙදාහැරීමේ ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 03)

(c) හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු බද්ද **ගණනය කරන්න**. (ලකුණු 04)

**සැ.යු:** යම් ලැබීමක් බද්දෙන් නිදහස් ලෙස සළකන්නේ නම් ඊට හේතු සඳහන් කරන්න. (මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**ෂාප් ඇසෝසියේට්ස්** වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක් වන අතර එය වෘත්තීය ගිණුම්කරණ සේවා සැපයීමේ ව්‍යාපාරයේ නිරතව සිටියි. 2015 ජූනි 30 න් අවසන් වූ කාර්තුව සඳහා පහත තොරතුරු **ෂාප් ඇසෝසියේට්ස්** හි පොත්වලින් උපුටා ගන්නා ලදි:

(1)

| **නිකුත් කළ ඉන්වොයිසි:** | **සැපයුම්වල වටිනාකම** |
|---|---|
| දේශීය සේවාදායකයන්ට සැපයූ සේවාවන් වෙනුවෙන් | රු.4,250,000 |
| ඇමරිකානු ඩොලර් වලින් ගෙවීම සඳහා අනේවාසික (විදේශීය) සේවාදායකයන්ට සැපයූ සේවාවන් වෙනුවෙන් [ඇමරිකානු ඩොලර් ($) 1 = රු.141/-] | ඇමරිකානු ඩොලර් 6,500 |

(2) එකතුකළ අගය මත බද්ද (Value Added Tax - VAT) සඳහා ලියාපදිංචි නොවූ තැනැත්තෙකු හට ඡායා පිටපත් යන්ත්‍රයක් විකිණීමෙන් රු.166,500/- ක් ලැබී තිබුණි.

(3)

| **යෙදවුම් බද්ද** | **රු.** |
|---|---|
| කාර්යාල වියදම් මත | 130,000 |
| ගමන් බිමන් සඳහා භාවිත කරන වාහනයක් අළුත්වැඩියාව වෙනුවෙන් | 11,000 |

(4) පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන ආ හිලව් නොවූ (unabsorbed) යෙදවුම් බද්ද රු.36,000/- කි.

(5) රු.120,000/- ක් එකතු කළ අගය මත බදු වාරික වශයෙන් ගෙවා තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2015 ජූනි 30 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 07)

(b) 2015 ජූනි 30 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා නියමිත දින (due dates) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

**සීමාසහිත මතුරට (පෞද්ගලික) සමාගම** රබර් ආශ්‍රිත නිෂ්පාදිත, නිෂ්පාදනයේ නිරත වාසික සමාගමකි. සමාගම, 2013/14 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව නියමිත වේලාවට ගොනු කර තිබුණි. නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් ආදායම් වාර්තාව ප්‍රතික්ෂේප කර තක්සේරුවක් නිකුත් කරන ලදි. සමාගම, තක්සේරුවට විරුද්ධව අභියාචනයක් කිරීමට බලාපොරොත්තු වෙයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) වලංගු ආදායම් බදු අභියාචනයක තිබිය යුතු අවශ්‍යතා **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රමාද වූ අභියාචනයක් පිළිගනු ලැබිය හැකි අවස්ථාවන් **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) වලංගු අභියාචනයක් ලැබීමෙන් පසු එම අභියාචනය සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගනු ලබන ඊළඟ පියවර **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත රජරට ඉම්පෝටර්ස් (පෞද්ගලික) සමාගම,** 2014 අප්‍රේල් 01 වන දින සංස්ථාපනය කරන ලද අතර කෘෂි උපකරණ ආනයනය කර දේශීය වෙළෙඳපොලේ විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටී. 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු පෙර ශුද්ධ ලාභය රු.12,847,325/- ක් විය.

(2)

| **වෙනත් ආදායම්** | **රු.** |
|---|---|
| ලාභාංශ ආදායම - රඳවා ගැනීමේ බදු අඩු කිරීමෙන් පසු ශුද්ධ | 90,000 |
| භාණ්ඩාගාර බිල්පත් වලින් ලද පොලී ආදායම | 243,000 |
| **එකතුව** | **333,000** |

(3)

| **බදුපෙර ලාභය ලබා ගැනීමේදී අයකළ වියදම්** | **සටහන** | **රු.** |
|---|---|---|
| පරිපාලන වියදම් | 1 | 8,407,200 |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 2 | 1,050,000 |
| මූල්‍ය හා වෙනත් වියදම් | 3 | 95,275 |
| **එකතුව** | | **9,552,475** |

(4) **01 වන සටහන - පරිපාලන වියදම්:**

| | **සටහන** | **රු.** |
|---|---|---|
| වැටුප් හා වේතන | | 4,228,000 |
| සේවක අර්ථ සාධක සහ භාරකාර අරමුදල් | | 634,200 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | | 136,000 |
| ක්ෂය වීම් | | 294,000 |
| සංග්‍රහ වියදම් | | 38,000 |
| දේශීය ගමන් වියදම් | | 68,000 |
| විදේශීය ගමන් වියදම් | 1.1 | 184,000 |
| සමාගම පිහිටුවීමේ (formation) වියදම් | 1.2 | 285,000 |
| පරිත්‍යාග | 1.3 | 100,000 |
| නීති වියදම් | 1.4 | 128,000 |
| කුලී | | 420,000 |
| උපයෝගිතා (Utilities) | | 136,000 |
| වෙනත් වියදම් | | 1,756,000 |
| **එකතුව** | | **8,407,200** |

**1.1 වන සටහන - විදේශීය ගමන් වියදම්**

කළමනාකරණ අධ්‍යක්ෂවරයා සැපයුම්කරුවන් හමුවීමට චීනයට ගිය අතර ඔහුගේ සංචාරය සඳහා දැරූ වියදම් විදේශ ගමන් වියදම් යටතේ වාර්තා කර තිබේ.

**1.2 වන සටහන - සමාගම පිහිටුවීමේ (formation) වියදම්**

සමාගම පිහිටුවීමේ වියදම්වල පහත ඒවා ඇතුලත් වේ:

| | **රු.** |
|---|---|
| සමාගම පිහිටුවීම සම්බන්ධයෙන් දරන ලද නීති ගාස්තු | 235,000 |
| කොටස් නිකුත් කිරීමේ වියදම් | 50,000 |
| **එකතුව** | **285,000** |

**1.3 වන සටහන - පරිත්‍යාග**

වර්ෂය තුලදී සමාගම රු.100,000/- ක් "අපි වෙනුවෙන් අපි අරමුදලට" පරිත්‍යාග කර ඇත.

**1.4 වන සටහන - නීති වියදම්**

වර්ෂය තුළදී, රේගු බදු වංචා කිරීමක් සම්බන්ධයෙන් රේගුව විසින් සමාගමට විරුද්ධව නඩු පවරා ඇත. සමාගම වෙනුවෙන් පෙනී සිටීම වෙනුවෙන් නීතිඥවරයෙකුට රු.128,000/- ක් ගෙවා ඇත.

(5) **2 වන සටහන - විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්**

| | | **රු.** |
|---|---|---|
| ප්‍රචාරණය | 2.1 සටහන | 475,000 |
| විකුණුම් කොමිස් | | 575,000 |
| **එකතුව** | | **1,050,000** |

**2.1 වන සටහන - ප්‍රචාරණය**

සමාගම ප්‍රචාරණය සඳහා පහත වියදම් දරා ඇත:

| | **රු.** |
|---|---|
| ශ්‍රමිකයන් බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් | 25,000 |
| විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරණ දැන්වීම් | 450,000 |
| **එකතුව** | **475,000** |

(6) **3 වන සටහන - මූල්‍ය හා වෙනත් වියදම්**

| | | **රු.** |
|---|---|---|
| කල්බදු පොලිය | 3.1 වන සටහන | 14,325 |
| ණය පොලිය | 3.2 වන සටහන | 68,200 |
| බැංකු ගාස්තු | | 12,750 |
| **එකතුව** | | **95,275** |

**3.1 වන සටහන - කල්බදු පොලිය**

2014 ජූලි 01 වන දින, ලැප්ටොප් පරිගණක දෙකක් මාස 24 ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ ලබා ගන්නා ලදී. මාසික කල්බදු වාරිකය රු.7,600/- ක් විය. වර්ෂය තුළදී සමාගම වාරික 9 ක් ගෙවා තිබුණි.

**3.2 වන සටහන - ණය පොලිය**

සමාගම, ගබඩාවක් ඉදි කිරීම සඳහා ඉඩම් කැබැල්ලක් මිලට ගන්නා ලදී. මේ සඳහා වාණිජ බැංකුවකින් ණයක් ලබා ගන්නා ලදී. මෙම ණය මුදල සඳහා ගෙවූ පොලිය ආදායම් ප්‍රකාශනයට අයකර තිබුණි.

(7) දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

- 2015 මාර්තු 31 දිනට දේපළ, පිරියත හා උපකරණ වල විස්තර පහත පරිදි වේ:

| **වත්කම් වර්ගය** | **පිරිවැය (රු.)** |
|---|---|
| ඉඩම | 1,000,000 |
| කාර්යාල උපකරණ | 78,000 |
| ලොරි රථය | 2,500,000 |
| ගෘහ භාණ්ඩ | 26,000 |
| පරිගණක උපකරණ | 280,000 |
| පරිගණක මෘදුකාංග - ශ්‍රී ලංකාවේදී සංවර්ධනය කරන ලද | 65,000 |
| ලැප්ටොප් පරිගණක - කල්බදු වත්කම් | 160,000 |
| **එකතුව** | **4,109,000** |

- කල්බදු වත්කම් හැර අනෙක් සියලුම වත්කම්, සමාගම සංස්ථාපනය කරන අවස්ථාවේදී මිලට ගන්නා ලදී.

(8) සමාගම, ස්ව-තක්සේරු පදනම (self-assessment) යටතේ රු.1,500,000/- ක් ආදායම් බදු වශයෙන් ගෙවන ලදී.

**ඔබ විසින්:**

2014/15 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(b) තක්සේරු කළ හැකි ආදායම,

(c) බදු අයකළ හැකි ආදායම,

(d) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(e) ගෙවිය යුතු ඉතිරි බද්ද.

**සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුය. (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **රත්නායක** ක්ෂුද්‍ර මූල්‍ය (Micro Finance) සමාගමක අලෙවි කළමනාකරුවෙකු ලෙස සේවය කරයි. 2014/15 තක්සේරු වර්ෂය (මින් මතු "වර්ෂය" යැයි හැඳින්වෙන) සඳහා **රත්නායක** සම්බන්ධව පහත තොරතුරු සපයා ඇත:

(1) ඔහුට රු.80,000/- බැගින් මාසික වැටුප් ලැබී ඇත. 2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභ පදනම් කරගෙන එක් මාසයක වැටුප ප්‍රසාද දීමනාවක් ලෙස 2014 දෙසැම්බර් මාසයේ දී ඔහුට ගෙවන ලදී.

(2) තවද, මාසයකට රු.15,000/- බැගින් සංග්‍රහ දීමනාවක් ද ඔහුට ලැබී තිබුණි.

(3) සමාගම ඔහුට ඉන්ධන සමග මෝටර් බයිසිකලයක් සපයා තිබූ අතර භාවිතය සඳහා වාර්තා පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(4) වර්ෂය සඳහා අඩු කරගෙන ඇති උපයනවිට ගෙවීමේ බද්ද (PAYE) රු.29,596/- කි.

(5) ඔහු ජීවත් වන්නේ ඔහුගේ දෙමාපිය උරුමයෙන් ලද නිවසක ය. එම නිවසේ ශුද්ධ වාර්ෂික වටිනාකම රු.120,000/- කි.

(6) **රත්නායකට** තවත් නිවසක් පිළියන්දල තිබෙන අතර එය මාසයකට රු.50,000/- බැගින් 2014 අප්‍රේල් මාසයේ සිට කුලියට දී තිබේ. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.135,000/- ක් වන අතර 20% බැගින් වරිපනම් ගෙවනු ලබයි.

(7) වර්ෂය තුළදී ඔහු රු.1,250,000/- කට ඉඩමක් විකුණා ඇත. එම ඉඩම ඔහුගේ මිත්තණිය විසින් 2000 වර්ෂයේදී ඔහුට තෑගි කරන ලද අතර එදිනට එහි වෙළෙඳපොල වටිනාකම රු.500,000/- ක් විය.

(8) වර්ෂය තුළදී ඔහුට ස්ථාවර තැන්පතු මත රු.82,800/- ක පොලියක් (8% බැගින් රඳවා ගැනීමේ බදු අඩු කළ පසු) ලැබී තිබුණි.

(9) ඔහුට **සීමාසහිත මැජික් හෝල්ඩින් පොදු සමාගමෙන්** ලාභාංශ ලැබී තිබුණි. ලාභාංශ බලපත්‍රයේ තොරතුරු පහත පරිදි විය:

| | දළ ලාභාංශ (රු.) | රඳවා ගැනීමේ බදු (රු.) | ශුද්ධ ලාභාංශ (රු.) |
|---|---|---|---|
| වෙනත් සමාගම් වලින් ලැබුණු ලාභාංශ වලින් ගෙවන ලද | 40,000 | 4,000 | 36,000 |
| ලාභ සහ ආදායම් වලින් ගෙවන ලද | 20,000 | 2,000 | 18,000 |
| **එකතුව** | **60,000** | **6,000** | **54,000** |

(10) **රත්නායක** පිළියන්දල පිහිටි නිවස ඉදි කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් නිවාස ණයක් ලබාගෙන තිබුණි. වර්ෂය තුළදී ඔහු මෙම ණය සඳහා පොලිය සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම ලෙස පිළිවෙලින් රු.64,000/- ක් සහ රු.82,000/- ක් ගෙවා තිබුණි.

(11) ඔහු, අවතැන් වූ ළමයින්ට ආයතනිකමය රැකවරණය (institutionalized care) සැපයීම සඳහා පිහිටුවා ඇති අනුමත පුණ්‍යායතනයකට රු.25,000/- ක් පරිත්‍යාග කර ඇත.

(12) ඔහු වාර්ෂික ජීවිත රක්ෂණ වාරිකය ලෙස රු.53,400/- ක් ගෙවා ඇත. එය අවුරුදු 10 ක් පුරා වාර්ෂිකව වාරික ගෙවිය යුතු ඔප්පුවකි.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2014/15 තක්සේරු වර්ෂය සඳහා **රත්නායකගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**.

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(c) ගෙවිය යුතු ඉතිරි බද්ද.

**සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුය. (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |